# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2369/41 – 2024 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා – 2024.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/20/21/2013.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

අංක 2353/74 දරන හා 2023.10.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන්, පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි පදිංචි ජාතික සේවක සංගමය සහ කොළඹ 03, ගාලු පාර, අංක 411, ඊ.එච්.කුරේ ගොඩනැගිල්ල හි පිහිටි ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A52/2021 දරන හා 2023.09.11 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A52/2021 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.10.13 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජනවාරි මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 41350 – 20 (2024/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

*1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත*

**බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය: ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්, නොඃ 411, E.H. කුරේ ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03.
දිනය: 2024.01.04.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.
2023.10.13 දිනැති අංක 2353/74 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද ජාතික සේවක සංගමය සහ ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් බැඳී සිටින්නාවූ ද 2023.09.11 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන

පිටපතඃ (අනෙක් පාර්ශ්වය) ජාතික සේවක සංගමය, නො 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ (ලි.ප.තැ) මඟින් යොමු කරන ලදී.

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) සහ 20(1) වන වගන්තිය බලන්න)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 02 - 0016

---

*මගේ අංකය*: IR/COM/03/2020/255.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2335/07 දරන හා 2023.06.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් හපුගල, බටුවන්තුඩාව පාර, යුනිවර්සල් සිටි, අංක 77 හි පදිංචි එම්.ජී. උජිතා රසාංගනී මිය ඇතුළු සේවකයින් තිදෙනා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් ගාල්ල, පහල ඩික්සන් පාර, අංක 19 හි පිහිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 76/2022 දරන හා 2023.04.17 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 76/2022 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.06.06 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජනවාරි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

***1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත***

**බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම.**

ලිපිනය: දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.
දිනය: 2023.12.21.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2023.06.06 දිනැති අංක 2335/07 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද එම්.ජී. උජිතා මිය ඇතුළු සහ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය බැඳී සිටින්නාවූ ද 2023.04.17 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන

පිටපතඃ (අනෙක් පාර්ශ්වය)

01. එම්.ජී. උජිතා රසාංගනී, අංක 77, යුනිවර්සල් සිටි, බටුවන්තුඩාව පාර, හපුගල

02. චන්ද්‍රිකා ජානකී ගුණතිලක, නො 25, හබරකඩ නැගෙනහිර, ගා/තවලම

03. ඩී.ජී. ජයන්තා, අත්තම්දඬුපෙවත්ත, බංගම පාර, ඉඹුල්ගොඩ, අකුරැස්ස

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) සහ 20(1) වන වගන්තිය බලන්න)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 02 - 0017

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.